




## රැකියා ගිවිසුම අවසන් කිරීම

එක් පාර්ශ්වයක් මඟින් අනෙක් පාර්ශවයට මාසයකට පෙර දැන්වීම මඟින් හෝ මාසයක් සඳහා වූ ගෙවීමක් කිරීමෙන් පසු රැකියා ගිවිසුම අවසන් කල හැකි වේ.



සේවය අවසන් කිරීමේ ගෙවීම් වලට ඇතුළත් විය හැකි දෑ වන්නේ:


- හිඟ වැටුප්;
- දැනුම්දීම වෙනුවට ගෙවීමක් සිදු කරන අවස්ථාවක, ගෙවීමට තිබේ නම්;
- ලබා නොගත් වාර්ෂික නිවාඩු වෙනුවට සිදු කරනු ලබන ගෙවීම්;
- දීර්ඝ කාලීන සේවා සඳහා වන ගෙවීම් / සේවය අවසන් කිරීමේ ගෙවීම්, සුදුසු අවස්ථාවල; සහ
- රැකියා ගිවිසුම යටතේ වෙනත් ඕනෑම මුදලක්, උදා. නොමිලේ ආපසු යාම, ආහාර සහ ගමන් දීමනා ආදිය.



## සේවය අවසන් කිරීමේ ගෙවීම්

විදේශීය ගෘහ සහායකයෙකු සඳහා පහත තත්ත්ව අදාල වේ නම් ඔහුට/ ඇයට සේවය අවසන් කිරීමේ ගෙවීම් සඳහා හිමිකම් ලැබේ:

- සේවය අවසන් කිරීමට පෙර එකම සේවායෝජකයා සමඟ මාස 24 කට නොඅඩු සේවා කාලයක් සේවය කර තිබීම; සහ
- සේවයෙන් ඉවත් කිරීම හෝ අතිරික්තය හේතුවෙන් රැකියා ගිවිසුම අළුත් නොකිරීම.






## දීර්ඝ කාලීන සේවා සඳහා වන ගෙවීම්

සේවය අවසන් කිරීමට පෙර එකම සේවායෝජකයා සමඟ වසර 5 කට නොඅඩු සේවා කාලයක් සේවය කර තිබෙන්නේ නම් සහ එම විදේශීය ගෘහ සේවකයාට පහත කරුණු සම්පූර්ණ කරන්නේ නම් ඔහු/ඇය හට දීර්ඝ කාලීන සේවා සඳහා වන ගෙවීම් හිමි වේ:

- සේවයෙන් ඉවත් කර තිබීම හෝ බරපතල විෂමාචාර ක්‍රියාවක් හෝ අතිරික්තය හැර වෙනත් හේතුවක් නිසා ගිවිසුම අළුත් නොකිරීම;
- අසනීප තත්ත්වය හේතුවෙන් ඉල්ලා අස්වීම;
- මහළු වයස නිසා ඉල්ලා අස්වීම (එනම් වයස අවුරුදු 65 හෝ ඊට වැඩි); හෝ
- සේවයේදී මිය යෑම.

## දීර්ඝ කාලීන සේවා සඳහා වන ගෙවීම් හෝ සේවය අවසන් කිරීමේ ගෙවීම් ප්‍රමාණය




මාසික වැටුප් x 2/3 x සේවය කල අවුරුදු ගණන

අසම්පූර්ණ වර්ෂයක සේවය ගණනය කළ යුත්තේ අනුපාතයකට අනුව ය.

විදේශීය ගෘහ සේවකයෙක් දීර්ඝ කාලීන සේවා සඳහා වන ගෙවීම් හෝ සේවය අවසන් කිරීමේ ගෙවීම් යන දෙකෙන් එකකට පමණක් හිමිකම් ලබයි.

ඉහත තොරතුරු මඟින් විදේශීය ගෘහ සේවකයින් පොදුවේ සැලකිලිමත් වන ප්‍රධාන ව්‍යවස්ථාපිත හා ගිවිසුම්ගත විධිවිධානවල ඉස්මතු කිරීම් පමණක් දක්වා ඇත.

විදේශීය ගෘහ සේවකයින්ගේ රැකියා අයිතිවාසිකම් සහ ප්‍රතිලාභ පිළිබඳ විස්තර සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු සබඳතා අංශයේ ශාඛා කාර්යාලවලින් ලබා ගත හැකි "විදේශීය ගෘහ සේවකයින් රැකියාවට ලබාගැනීමට සඳහා ප්‍රායෝගික මග පෙන්වීම" හෝ "රැකියා ආඥාපණතේ සංක්ශිප්ත මග පෙන්වීම" වෙතට යොමු වන්න.



## විමසීම් අංකය ("1823" විසින් හසුරුවනු ලැබේ)

2717 1771

2157 9537 (විදේශීය ගෘහ සේවකයින් සඳහා කැපවූ දුරකථන අංකයකි)



## මුල් පිටුවේ ලිපිනය

www.labour.gov.hk

www.fdh.labour.gov.hk

## පෞද්ගලික විමසීම් සඳහා කම්කරු සබඳතා අංශයේ කාර්යාල වෙත පිවිසෙන්න.

| | |
|---|---|
| **HONG KONG** | |
| **Hong Kong East**<br>12/F., 14 Taikoo Wan Road, Taikoo Shing, Hong Kong. | **Hong Kong West**<br>3/F., Western Magistracy Building, 2A Pokfulam Road, Hong Kong. |
| **KOWLOON** | |
| **Kowloon South**<br>2/F., Mongkok Government Offices, 30 Luen Wan Street, Mong Kok, Kowloon. | **Kowloon West**<br>Room 1009, 10/F., Cheung Sha Wan Government Offices, 303 Cheung Sha Wan Road, Sham Shui Po, Kowloon. |
| **Kowloon East**<br>UGF, Trade and Industry Tower, 3 Concorde Road, Kowloon. | **Kwun Tong**<br>Units 801-806, 8/F., Tower 1, Millennium City 1, 388 Kwun Tong Road, Kwun Tong, Kowloon. |
| **NEW TERRITORIES** | |
| **Sha Tin & Tai Po**<br>Rooms 304-313, 3/F., Sha Tin Government Offices, 1 Sheung Wo Che Road, Sha Tin, New Territories. | **Kwai Chung**<br>6/F., Kwai Hing Government Offices, 166-174 Hing Fong Road, Kwai Chung, New Territories. |
| **Tsuen Wan**<br>5/F., Tsuen Wan Government Offices, 38 Sau Lau Kok Road, Tsuen Wan, New Territories. | **Tuen Mun**<br>Unit 2, East Wing, 22/F., Tuen Mun Central Square, 22 Hoi Wing Road, Tuen Mun, New Territories. |

අදාළ කාර්යාලවල ලිපිනයන් වෙනස් වීමට යටත් වේ. විස්තර සඳහා කරුණාකර වෙබ් පිටුවට පිවිසෙන්න www.labour.gov.hk/eng/tele/lr1.htm

විදේශ ගෘහස්ථ සේවක කටයුතු සඳනා කැප වූ විද්‍යුත් ලිපින ගිණුම fdh-enquiry@labour.gov.hk

Sinhala version 斯里蘭卡文版本

# විදේශීය ගෘහ සේවකයින්

## රැකියා ආඥා පනත යටතේ අයිතිවාසිකම් සහ ආරක්ෂාව




勞工處 Labour Department




## විදේශීය ගෘහ සේවකයින් සඳහා සම්මත රැකියා ගිවිසුම

සම්මත රැකියා ගිවිසුම මඟින් හොංකොං හි විදේශීය ගෘහ සේවකයින්ගේ රැකියාවේ නියමයන් සහ කොන්දේසි පිළිබඳව හරියාකාර වශයෙන් සඳහන් කරනු ලැබේ. විදේශීය ගෘහ සේවිකාවන් සේවයේ යෙදවීම සඳහා හොංකොං විශේෂ පරිපාලන කලාපයේ රජය විසින් පිළිගත් එකම ලේඛනය එයයි.



සම්මත රැකියා ගිවිසුම යටතේ, ගෘහ සේවකයින්ට හිමිකම් ඇත්තේ:

- අවම අවසර ලත් වැටුපක් (ගිවිසුමේ 5(a) වගන්තිය)
- සේවා යෝජකයා විසින් ආහාර සපයන්නේ නොමැති නම් ආහාර දීමනාවක් (5(b) වගන්තිය)
- නොමිලේ නවාතැන් පහසුකම් (5(b) වගන්තිය)
- ඔවුන්ගේ උපන් ස්ථානයට සහ ඉන් පිටතට නොමිලේ ගමන් කිරීමේ පහසුකම් (7(a) වගන්තිය)
- වෛද්‍ය උපදෙස්, රෝහලේ ගතවීමේදී නඩත්තුව සහ හදිසි දන්ත ප්‍රතිකාර ඇතුළු නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර (9(a) වගන්තිය)
- සේවා යෝජකයාගේ වියදමින් ගමන් කිරීමේ පිරිවැය සමඟ වැටුප් සහිත හෝ රහිත නිවෙස් වෙත යාමේ නිවාඩු (13 වගන්තිය)

## අවම අවසර ලත් වැටුප


සේවායෝජකයින් ගිවිසුම අත්සන් කරන විට පවතින අවම අවසර ලත් වැටුපක් වඩා නොඅඩු වැටුපක් විදේශීය ගෘහ සේවකයින්ට ගෙවිය යුතුය.






## වැටුප් ගෙවීම

වැටුප් කාලය අවසන් වන හෝ ගිවිසුම අවසන් වන දින සිට දින 7 කට නොඅඩු කාලයකදී වැටුප් ගෙවිය යුතුයි වේ.



## වැටුප් අඩුවෙන් ගෙවීම

ලැබෙන වැටුප් රැකියා ගිවිසුමේ නියම කර ඇති වැටුපට වඩා අඩු නම්, විදේශීය ගෘහ සේවකයා:

- සේවායෝජකයා සමඟ නිවැරදි මුදල පිළිබඳව පැහැදිලි කර ගැනීම;
- නොගෙවා ඇති වැටුප් වලට අදාල ලදු පත් භාර නොගැනීම; සහ
- අඩුවෙන් වැටුප් ගෙවා ඇත්නම්, හැකි ඉක්මනින් කම්කරු දෙපාර්තමේන්තුවට වාර්තා කරන්න.




## වැටුපෙන් අඩු කිරීම

පහත අවස්ථා වල හැර වැටුප් අඩු කිරීම තහනම්ය:

- විදේශීය ගෘහ සේවකයාගේ නොසැලකිල්ල හෝ පැහැර හැරීම හේතුවෙන් සේවා යෝජකයාගේ භාණ්ඩ හෝ දේපළවලට හානි වීම හෝ අහිමි වීම හේතුවෙන්. එක් එක් සිද්ධියේදී අඩු කළ මුදල HK$300 නොඉක්මවිය යුතුය;
- සේවයට නොපැමිණි විට එම කාලයට සමානුපාතික වන සහ එය නොඉක්මන මුදලක්;
- අත්තිකාරම් අයකර ගැනීමකදී හෝ වැටුප් වැඩිපුර ගෙවීමකදී; සහ
- සේවකයාගේ ලිඛිත ඉල්ලීම මත සේවකයාට ලබා දුන් ණය මුදල් ආපසු අයකර ගැනීමකදී.

රැකියාවෙන් බැහැරව සිටීම හැර මුළු අඩු කිරීම්, එම වැටුප් කාල සීමාව තුළ ගෙවිය යුතු වැටුපෙන් අඩක් නොඉක්මවිය යුතුය.



## විවේක දින

විදේශීය ගෘහ සේවකයෙක්:

- සෑම දින 7 ක කාල පරිච්ඡේදයකම අවම වශයෙන් එක් විවේකදිනයක්වත් තිබිය යුතුය; සහ
- විවේක දිනයක ස්වේච්ඡාවෙන් වැඩ කළ හැකිය.

සේවා යෝජකයෙකු විවේක දිනයක වැඩ කිරීමට සේවකයෙකුට බල නොකළ යුතුය.



## ව්‍යවස්ථාපිත නිවාඩු

විදේශීය ගෘහ සේවකයෙක් පහත දෑ සඳහා හිමිකම් කියනු ලැබේ:

- ව්‍යවස්ථාපිත නිවාඩු; සහ
- ඕනෑම ව්‍යවස්ථාපිත නිවාඩු දිනයකට පෙර ඔහු / ඇය අවම වශයෙන් මාස 3 ක් සේවය කර ඇත්නම් නිවාඩු දීමනා ගෙවීම.

ව්‍යවස්ථාපිත නිවාඩු දිනයක් ලබා දීම වෙනුවට මුදල් ගෙවීමට අවසර නැත.



ව්‍යවස්ථාපිත නිවාඩු දිනය විවේක දිනයක වැටෙන්නේ නම්, විවේක දිනයට පසු දින නිවාඩු දිනයක් ලෙස ලබා දිය යුතුය.


සේවකයාට නිවාඩු දිනයේ වැඩ කිරීමට සිදු වූයේ නම් ව්‍යවස්ථාපිත නිවාඩුවට පෙර හෝ පසුව දින 60 ක් ඇතුළත විකල්ප නිවාඩු දිනයක් සංවිධානය කළ යුතුය.



## වාර්ෂික නිවාඩු

විදේශීය ගෘහ සේවකයෙක් පහත දැක්වෙන අනුපාතයට එම සේවා යෝජකයා සමඟ සෑම මාස 12 ක කාල සීමාවක් තුළ සේවය කිරීමෙන් පසු වැටුප් සහිත වාර්ෂික නිවාඩු සඳහා හිමිකම් ලබයි:

- පළමු හා දෙවන සේවා වර්ෂ සඳහා දින 7 බැගින්; සහ
- තුන්වන වසරේ සිට ආරම්භ වන පරිදි මෙම සංඛ්‍යාව වසරකට දින 1 ක් බැගින් උපරිම දින 14 ක් දක්වා වැඩිවේ.



## අසනීප දීමනාව

විදේශීය ගෘහ සේවකයෙකු සඳහා පහත තත්ත්ව අදාල වේ නම් ඔහුට/ ඇයට අසනීප දීමනාවකට හිමිකම් ලැබේ:

- වැටුප් සහිත අසනීප නිවාඩු දින ඉතුරු කර ගෙන ඇති විට;
- ලබා ගෙන ඇති අසනීප නිවාඩු දින ගණන එක දිගට දින 4 කට වඩා නොඅඩු වන විට; සහ
- අසනීප නිවාඩුව සුදුසු වෛද්‍ය සහතිකයක් මගින් තහවුරු කර ඇති විට.

අසනීප දීමනාවේ දෛනික අනුපාතය සේවකයාගේ සාමාන්‍ය දෛනික වැටුපෙන් පහෙන් හතරක පංගුවකට සමාන මුදලක් වේ.



## මාතෘ නිවාඩු

විදේශීය ගෘහ සේවිකාවක් ගර්භණීභාවය පිළිබඳ සේවායෝජකයාට දැනුම් දී ඇත්නම් සහ මාතෘ නිවාඩු ලබා ගැනීම සඳහා ඇයගේ අභිප්‍රාය ලබා දී ඇත්නම් ඇය සති 14ක මාතෘ නිවාඩු සඳහා සුදුසුකම් ලබයි. ඇය අදාළ නිර්ණායක සපුරාලන්නේ නම් ඇයගේ සාමාන්‍ය දෛනික වැටුපෙන් පහෙන් හතරක දෛනික අනුපාතයකට අනුව මාතෘ නිවාඩු ගෙවීමකට ඇයට හිමිකම් ඇත.

සේවිකාවකගේ බරපතල විෂමාචාරයන් හැරුණු විට, ගර්භනී, මාතෘ නිවාඩු හෝ වැටුප් සහිතව අසනීප නිවාඩු මත සිටින සේවිකාවක සේවයෙන් පහ කිරීම සේවා යෝජකයාට තහනම් කර ඇත.